සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**

DSD/HO/13/HR/004/T.C./මූල්‍ය /පාලන-2024 ඔබේ අංකය / உமது இல / Your No ............................................ දිනය / திகதி Date 2024.02. 14

## මූල්‍ය චක්‍රලේඛ අංක - 2024/04

සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් ,

සියළුම පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරිවරුන්,

### *මූල්‍ය පාලනය පිළිබඳ උපදෙස්*

### *නිල්ලඹ, මාතර, සමනල වැව සහ නිලාවේලි පුහුණු මධ්‍යස්ථාන*

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් නිල්ලඹ සහ සමනල වැව මාතර පුහුණු මධ්‍යස්ථානය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය මඟින් ද, නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශය මඟින් ද පාලනය කෙරේ. එම පුහුණු මධ්‍යස්ථාන සම්බන්ධව බල පැවැත්වෙන පොදු පරිපාලන හා මූල්‍ය බලතල පිළිබඳව වාර්ෂිකව නිකුත් කරනු ලබන පරිපාලන හා මූල්‍ය උපදෙස්වලට අතිරේක වශයෙන් පුහුණු මධ්‍යස්ථානවලට විශේෂ වූ මූල්‍ය හා ගිණුම් කටයුතු සම්බන්ධව විධි විධාන 2024.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

**පුහුණු මධ්‍යස්ථාන පරිපාලනය :**

ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) යටතේ ඉහත නිල්ලඹ, මාතර හා සමනළවැව මධ්‍යස්ථානද, ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ හා සුභසාධන) යටතේ නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයද ක්‍රියාත්මක වන අතර ඔවුන් පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් සම්බන්ධව අධ්‍යක්ෂක ජනරාල්වරයාට වගකිව යුතුය. පුහුණු මධ්‍යස්ථාන භාරව මධ්‍යස්ථාන භාර නිලධාරියෙකු කටයුතු කරන අතර ඔහු අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) ගේ අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ හා සුභසාධන) ගේ සෘජු අධීක්ෂණය

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

යටතේ කටයුතු කල යුතුය. පුහුණු මධ්‍යස්ථාන වල මූල්‍ය හා පරිපාලන කටයුතු මෙහෙයවීම සම්බන්ධව දැනටමත් නිකුත් කර ඇති උපදෙස් හා චක්‍රලේඛ අනුව කටයුතු කිරීම ඔහුගේ වගකීම වේ.

මේ අනුව පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරි විසින් මධ්‍යස්ථානයේ පැවැත්වීමට සැළසුම් කර හෝ වෙන් කර ඇති බාහිර/අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පිළිබඳ ත්‍රෛමාසික සැලැස්මක් සකසා ප්‍රධාන කාර්යාලයේ මධ්‍යස්ථානය භාර අංශ ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු අතර, පුහුණු මධ්‍යස්ථානයේ වැඩසටහන් සඳහා බාහිර අභ්‍යන්තර ආයතන කලින් වෙන් කිරීමේදී ඒ බව ප්‍රධාන කාර්යාලය දැනුවත් කළ යුතුය.

<u>සේවක පරිපාලනය :</u>

පුහුණු මධ්‍යස්ථානවල සේවයේ නියුතු සියළුම කාර්ය මණ්ඩලය පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, සේවය අවසන් කිරීම හා විනය කටයුතු සිදු කිරීම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (පාලන) වෙත බලය පැවරෙන අතර අධ්‍යක්ෂ (පාලන) විසින් ඒ සම්බන්ධව කටයුතු කිරීමට පෙර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ හා සුභ සාධන) සහ පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරිගෙන් විමසා කටයුතු කල යුතුය.

දෛනික පැමිණීමේ ලේඛණය හා නිවාඩු ලේඛණය නඩත්තු කිරීම පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරිගේ වගකීම වන අතර මධස්ථාන වෙත අනුයුක්ත කර ඇති සියළුම කාර්ය මණ්ඩලය පූර්ණ උපයෝගිකරණය පිළිබඳව ඔහු වගකිව යුතු අතර පුහුණු මධ්‍යස්ථාන වල සේවය කරන නිළධාරීන්ගේ නිවාඩු වාර්තාවක් ප්‍රධාන කාර්යාලයේ අදාළ අංශ වෙත මාසිකව ලබා දිය යුතුය.

සේවක පරිපාලනයේදී සාමාන්‍ය තත්වයෙන් පරිබාහිර අවස්ථා ඇතිවූ විට ඒ පිළිබඳව අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) අධ්‍යක්ෂ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ හා සුභ සාධන) මගින් අධ්‍යක්ෂ (පාලන) අමතා පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු අඛණ්ඩව උපරිම කාර්යක්ෂමතාවයෙන් ඉටු කිරීම පිණිස කටයුතු කිරීම පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරීන් විසින් සිදුකල යුතුය. සෑම පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරියෙකු විසින්ම තමා යටතේ සේවය කරනු ලබන සියළුම නිලධාරින්ගේ වාර්ෂික වැටුප් වර්ධක නිර්දේශ කිරීමේදී ඇගයුම්කරු වශයෙන් කටයුතු කල යුතුය.

පුහුණු මධස්ථාන භාර නිලධාරීන්ගේ වැටුප් වර්ධක ලබාදීමේදී අදාළ වන පරිදි අධ්‍යක්ෂක / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්),අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ හා සුභ සාධන) ඇගයුම්කරු වශයෙන් කටයුතු කල යුතුය.

<u>ගිණුම් කටයුතු :</u>

සියළුම පුහුණු මධ්‍යස්ථාන ආදායම් උත්පාදන ආයතන වන බැවින් පහත සඳහන් ආදායම් මාර්ග වලින් ලැබෙන මුදල් නිසි පරිදි එකතු කර ගැනීම සහ එම මුදලින් වියදම් දැරීම හා ගිණුම් තැබීම සම්බන්ධව පහත සඳහන් උපදෙස් පිළිපැදීම සම්බන්ධව සියළුම මධ්‍යස්ථාන භාර නිළධාරීන් වගකිව යුතුය.

**ආදායම් එකතු කිරීම :**

**01.කාමර, ශාලා සහ දේශන ශාලා කුලියට දීම :**

සෑම පුහුණු මධ්‍යස්ථානයකම ඇති කාමර, ශාලා සහ දේශන ශාලාවන් කුලියට දීම තුලින් උපරිම ආදායම් එකතු කිරීම සිදුකල යුතු අතර ආකර්ශණීය හා කාර්යක්ෂම සේවාව ලබාදීමට හැකිවන පරිදි පුහුණු මධ්‍යස්ථාන ආකර්ෂණීය ස්ථාන ලෙස නඩත්තු කිරීම හා කාර්ය මණ්ඩලය අමුත්තන් හමුවේ සුහදශීලි ලෙස කටයුතු කිරීමට හැකිවන පරිදි නිරතුරුව සූදානම්ව තැබිය යුතුය.

**2024 01.01 දින_සිට මධ්‍යස්ථානවල ඇති කාමර සඳහා අයකරන ගාස්තු පහත දැක්වේ.**

**සමනල වැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ කාමර සඳහා අයකරන ගාස්තු**

| 01 නේවාසිකය (Circuit Bungalow) | | ඇඳන් ගණන | පවතින පහසුකම් | අය කිරීම (රු.) |
|---|---|---|---|---|
| 01 කාමරය | තනි කාමර | 03 | යාබද නාන කාමර | 2,250.00 |
| 02 කාමරය | තනි කාමර | 03 | යාබද නාන කාමර | 2,250.00 |
| 03 කාමරය | තනි කාමර | 04 | යාබද නාන කාමර | 3,000.00 |
| 04 කාමරය | තනි කාමර | 04 | යාබද නාන කාමර | 3,000.00 |
| 05 කාමරය | තනි කාමර | 03 | යාබද නාන කාමර | 2,250.00 |
| 06 කාමරය | තනි කාමර | 03 | යාබද නාන කාමර | 2,250.00 |

ඇඳන් 01 ක් , දින 01 සඳහා අය කිරීම :- රු. **750.00**

| 02 නේවාසිකය (Girls) | | ඇඳන් ගණන | පවතින පහසුකම් | අය කිරීම (රු.) |
|---|---|---|---|---|
| 01 කාමරය | තනි කාමර | 03 | පොදු නාන කාමර | 1,500.00 |
| 02 කාමරය | තනි කාමර | 04 | පොදු නාන කාමර | 2,000.00 |
| 03 කාමරය | තනි කාමර | 05 | පොදු නාන කාමර | 2,500.00 |
| 04 කාමරය | තනි කාමර | 06 | පොදු නාන කාමර | 3,000.00 |
| 05 කාමරය | තනි කාමර | 07 | පොදු නාන කාමර | 3,500.00 |
| 06 කාමරය | තනි කාමර | 08 | පොදු නාන කාමර | 4,000.00 |

ඇඳන් 01 ක්, දින 01 සඳහා අය කිරීම :- රු. **500.00**

| 03 නේවාසිකය (Circuit Bungalow II) | | ඇඳන් ගණන | පවතින පහසුකම් | අය කිරීම (රු.) |
|---|---|---|---|---|
| 01 කාමරය | තනි කාමර | 03 | පොදු නාන කාමර | 1,800.00 |
| 02 කාමරය | තනි කාමර | 04 | පොදු නාන කාමර | 2,400.00 |

ඇඳන් 01 ක්, දින 01 සඳහා අය කිරීම :- **රු. 600.00 (10% පරිපාලන ගාස්තු අය කෙරේ)**

| 04 නේවාසිකය (Boys) | | ඇඳන් ගණන | පවතින පහසුකම් | අය කිරීම (රු.) |
|---|---|---|---|---|
| 01 කාමරය | තනි කාමර | 03 | පොදු නාන කාමර | 1,500.00 |
| 02 කාමරය | තනි කාමර | 04 | පොදු නාන කාමර | 2,000.00 |
| 03 කාමරය | තනි කාමර | 05 | පොදු නාන කාමර | 2,500.00 |
| 04 කාමරය | තනි කාමර | 06 | පොදු නාන කාමර | 3,000.00 |
| 05 කාමරය | තනි කාමර | 07 | පොදු නාන කාමර | 3,500.00 |
| 06 කාමරය | තනි කාමර | 08 | පොදු නාන කාමර | 4,000.00 |

ඇඳන් 01 ක්, දින 01 සඳහා අය කිරීම :- **රු. 500.00**

**නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ කාමර සඳහා අයකරන ගාස්තු**

| නේවාසිකය | | ඇඳන් සංඛ්‍යාව | පවතින පහසුකම් | අයකිරීම් |
|---|---|---|---|---|
| **1. සිසිර නේවාසිකාගාරය** | | | | |
| 1. විශේෂ ත්‍රිත්ව කාමර සහිත විසිත්ත කාමරය | 1.1 | 3 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය (වායු සමීකරනය කර ඇත) | 4500.00 |
| | 1.2 | 2 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය | 2200.00 |
| | 1.3 | 2 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය | 2500.00 |
| 2 | | 3 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය | 2500.00 |
| 3 | 3 | 4 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය | 2,200.00 |
| | 3- 1 | 3 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය | 2,000.00 |
| 4 | 4 | 4 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය | 2,200.00 |
| | 4 -.1 | 3 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය | 2,200.00 |
| | 4 -.2 | 1 | උණුවතුර සහිත යාබඳ නාන කාමරය | |
| **2. A,B නේවාසිකාගාරය** | | | | |
| A ඉහළ මහළ | A 1 | 08 | උණුවතුර සහිත පොදු | 3,200.00 |
| | A 2 | 08 | උණුවතුර සහිත පොදු | 3,200.00 |

| | | | | |
|---|---|---|---|---|
| | A 3 | 06 | උණුවතුර සහිත පොදු | 2,400. 0 |
| | A 4 | 5 | උණුවතුර සහිත පොදු | 2,000.00 |
| | | 07 | උණුවතුර සහිත පොදු | 2,800.00 |
| | A 6 | 07 | උණුවතුර සහිත පොදු | 2,800.00 |
| **3. කාන්තා නේවාසිකාගාරය බිම් මහළ** | | | | |
| B පහළ මහළ | B3 | 07 | පොදු | 2,800.00 |
| | 4 | 11 | පොදු | 4,400 00 |
| | B1 | 08 | උණු වතුර සහිත යාබඳ | 4,500.00 |
| **4. පහළ නේවාසිකාගාරය** | **ප්‍රධාන නේවාසිකය** | **40** | **පොදු** | **20,000.00** |

නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ කාමර සඳහා අයකරන ගාස්තු

| 01 නේවාසිකය (Circuit Bungalow) | | ඇඳන් ගණන | පවතින පහසුකම් | අය කිරීම (රු.) |
|---|---|---|---|---|
| 01 කාමරය | තනි කාමර | 04 | පොදු නාන කාමර | 2,200.00 |
| 02 කාමරය | තනි කාමර | 07 | පොදු නාන කාමර | 3,500.00 |
| 03 කාමරය | තනි කාමර | 08 | පොදු නාන කාමර | 4,000.00 |
| 04 කාමරය | තනි කාමර | 09 | පොදු නාන කාමර | 4,400.00 |
| 05 කාමරය | තනි කාමර | 10 | පොදු නාන කාමර | 4,800.00 |
| 06 කාමරය | තනි කාමර | 11 | පොදු නාන කාමර | 5,200.00 |
| 07 කාමරය | තනි කාමර | තට්ටු ඇඳන් 20 | පොදු නාන කාමර | 7,500.00 |

ඇඳන් 01 ක්,දින 01 සඳහා අය කිරීම:- රු. **500.00 (10% පරිපාලන ගාස්තු අය කෙරේ)**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වැඩමුළු සහ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ වැඩමුළු සඳහා නේවාසික පහසුකම් ලබා දීමේදී පොදුවේ සියලුම නේවාසිකාගාර සඳහා දිනකට ඇඳන් 01ක් සඳහා රු 500.00 ක මුදලක් අය කළ යුතුය.

නේවාසික පහසුකම් ලබා දීමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වැඩමුළු සහ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශ වැඩමුළු සඳහා අයකරනු ලබන නේවාසික ගාස්තු මුදලින් 20% ක වට්ටමක් ද රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා 10% වට්ටමක් ද කාමර ගාස්තු වෙනුවෙන් පමණක් ලබාදිය යුතුය. කාමර පාවිච්චි කරන සෑම අවස්ථාවකින් පසුවම නැවත ඉල්ලූ විට ලබාදීමට හැකිවන පරිදි කාමර සූදානම් කර තැබිය යුතුය. කාමර, ශාලා සහ දේශන ශාලා නැවත සූදානම් කිරීම, නඩත්තු කිරීම සහ සනීපාරක්ෂක කටයුතු කිරීම වෙනුවෙන් කාමර ආදායමෙන් 20% උපරිමයකට යටත්ව වියදම් දැරිය හැකි වේ. මධ්‍යස්ථාන වෙත සනීපාරක්ෂක කම්කරුවන් බඳවාගෙන නොමැති අවස්ථාවකදී පිටතින් දෛනික පදනම යටතේ මුදල් ගෙවා සනීපාරක්ෂක කම්කරුවන්ගේ සේවාව ලබාගත යුතුය. (කම්කරු සහාය ලබා

ගැනීමේදී පුහුණු මධ්‍යස්ථානය පිහිටි ප්‍රාදේශීය සභාවේ අනුමත රේටයන් අනුව දෛනික වැටුප ගෙවිය යුතුය .)

විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙන පුහුණු මධ්‍යස්ථාන වල එම ඉඩම් උපරිම ආදායම් උත්පාදනය කිරීමට හැකි වන පරිදි වගා කටයුතු සිදුකිරීම හෝ වෙනත් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා බදු පදනම යටතේ හෝ කුලී පදනම යටතේ හෝ ලබාදීමේ හැකියාව සලකා බලා ඒ පිළිබඳව ප්‍රධාන කාර්යාලයේ ජීවනෝපාය සංවර්ධන අංශයේ හෝ අදාල අංශ ප්‍රධානීන්ගේ නිර්දේශ සහ අනුමැතිය පරිදි පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරි විසින් කටයුතු කල යුතුය. දැනට තේ සහ සුළු අපනයන බෝග වගාකර ඇති මධ්‍යස්ථාන වල ස්ථානභාර නිළධාරී නිසි පරිදි නඩත්තු කිරීමත් ආදායම් එකතු කිරීමත් පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ යුතු වේ. මෙම මධ්‍යස්ථාන වගා කළ යුතු අතර එය අමතර කාලවේලාවන්හිදී සිදුකළ යුතු අතර ලැබෙන ආදායම් නිවැරදිව සටහන් කළ යුතුය. මෙම එලදාවන් විකිණීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසිද්ධ දැන්වීමක් හරහා ගැනුම්කරුවන් සොයා ගත යුතු වේ.මෙම අමතර ආදායම් උත්පාදන ව්‍යාපෘති වලින් ලැබෙන ශුද්ධ ආදායමෙන් ප්‍රතිශතයක් (10%) මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය වෙත ලබා දීමට අනුමත කෙරේ. තේ සහ ගම්මිරිස් හා අනෙක් වගාවන් ඇති මධ්‍යස්ථාන භාර නිලධාරීන් එමගින් උත්පාදනය වන ආදායම් වශයෙන් ගිණුම් තැබිය යුතු අතර එම ආදායම් උත්පාදනය කිරීම සඳහා දරණ වියදම වාණිජ අත්තිකාරම් ගිණුමෙන් දැරිය යුතුය.

යම් පුහුණු වැඩමුළුවක් සඳහා බාහිර ආයතන වෙත වෙන් කරනු ලබන විට වැඩසටහනින් 50% ක අත්තිකාරම් මුදලක් වැඩමුළුව ආරම්භයට පෙර අයකර ගත යුතුය. එලෙසම පුහුණු මධ්‍යස්ථානය වෙන් කර නැවත අවලංගු කිරීමට අවශ්‍ය වන්නේ නම් අවම වශයෙන් දින 05 කට පෙරවත් ඒ බව වෙන් කරන ලද ආයතනය විසින් දැනුම් දී අවලංගු කළ යුතුය. එසේ කළ නොහැකි වන්නේ නම් අදාල ආයතනයේ ඇස්තමේන්තු මුදලෙන් 10% රඳවුම් ගාස්තු ලෙස ලබා ගත යුතුය.

පුහුණු මධ්‍යස්ථානයේ සේවකයින් පුහුණු වැඩමුළු නොපැවැත්වෙන අවස්ථාවලදී මධ්‍යස්ථානයේ කාර්‍යාල වේලාවෙන් පසුව නේවාසිකව සිටින්නේ නම් ඔවුන් ප්‍රධාන කාර්‍යාලයේ ලිඛිත අවසරය ලබා ගත යුතුය. එසේ අවසර මත සිටින්නේනම්,විදුලිය හා නඩත්තු වියදම් වශයෙන් යම් සාධාරණ වූ ගාස්තුවක් ආයතන සංග්‍රහය XIV-5.3.1 පරිදි වැටුපෙන් 5% රජයට මාසිකව ගෙවිය යුතුය.

**01. දේශණ ශාලා සහ උපකරණ කුලියට දීම :**

<u>**දේශණ ශාලා සහ උපකරණ කුලියට දීම**</u>

01. දේශණ ශාලාව සඳහා පැය 08 ක් සඳහා රු. 7,500.00 යි.
02. ආසන 50 දේශණ ශාලාව පැය 08 ක් සඳහා රු. 4,000.00
    (දේශණ ශාලා සඳහා වැඩිවන සෑම පැය 01 කට රු.1,000.00 ක් අය කරනු ලැබේ)
03. මල්ටි මීඩියා පැය 01 සඳහා රු. 600.00 යි.
04. ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා පැය 01 සඳහා රු. 300.00 යි.
05. සකසන ලද පොල්තෙල් පහන රු.750.00 යි.
06. ලැප්ටොප් පරිගණකය පැය 01 සඳහා රු. 300.00 යි.

**භෝජනාගාර පහසුකම්**

01. භෝජනාගාරය පරිහරණය කිරීමේදී භෝජනාගාර උපකරණ සමඟ (පිඟන්,කෝප්ප සහ විදුරු) පැය 08 ක් සඳහා 5000.00 යි. (වැඩිවන සෑම පැය 01 ක් සඳහා රු. 500.00 ක් අය කරනු ලැබේ)

02. බැහැරගත ක්‍රියාකාරකම් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා භූමිය ලබා දීමේදී රු. 2,000.00 ක ගාස්තුවක් අය කෙරේ. (පැය 08 ක් සඳහා)

ඉහත සියලුම පහසුකම් බාහිර ආයතන වෙත ලබාදීමේදී 10% ක පරිපාලන ගාස්තු මුදලක් අය කළ යුතුය.

විවිධ ආයතනවලට සේවා සැපයීමේදී එම ආයතනයේ කැඳවීමකින් පැමිණි අයෙකුගෙන් මධ්‍යස්ථානයේ උපකරණ වලට කිසියම් හානියක් සිදු වුවහොත් එහි අලාභය ගෙවිය යුතු බව ඇස්තමේන්තුව ලබා දෙන අවස්ථාවේදී ලිඛිතව දැනුවත් කළ යුතුය.

**වියදම් දැරීම :**

**01. ආහාර සැපයීම :**

සියළුම පුහුණු මධ්‍යස්ථානවල ආහාර සැපයීමේ ඒකකයක් නඩත්තු කල යුතු අතර, එම ඒකකය ගබඩාව සහ මුළුතැන්ගෙය වශයෙන් සමන්විත විය යුතුය. එම ගබඩාව පිරිසිදුව සහ සකසුරුවම් ලෙස නඩත්තු කල යුතු අතර, ගබඩාවේ භාණ්ඩ නිවැරදිව අසුරා කෘමීන්ගෙන්, ජලයෙන්, දූවිල්ලෙන්, වැස්සෙන් ආරක්ෂා වන පරිදි පරිහරණය කල යුතු අතර, පුහුණු මධ්‍යස්ථානවලට පැමිණෙන පාරිභෝගිකයින්ට ආහාර පාන අවශ්‍යතා සැපිරීම මධ්‍යස්ථානභාර නිළධාරීන්ගේ වගකීම වේ නවීන උපකරණ වලින් සමන්විත මුළුතැන්ගෙයක් සෑම මධ්‍යස්ථානයක්ම සෞඛ්‍ය ආරක්ෂිත ලෙස නඩත්තු කර යාවත්කාලීන කල යුතුය.

සියළුම පුහුණු මධ්‍යස්ථානවල ආහාර සැපයීමේදී පහත සඳහන් ආහාර වට්ටෝරු පරිදි සේවා සැපයීමට කටයුතු කල යුතු අතර **2024 01.01** දින සිට පහත දක්වා ඇති මිල ගනන්, ආහාර පාන වෙනුවෙන් අයකල යුතුය.

| ආහාර වට්ටෝරුව | | | |
|---|---|---|---|
| අනු අංකය | | විස්තරය | මිල රු. |
| 01 | | **01.හිමිදිරි තේ** | |
| | 1.1 | කිරි තේ 01 ක් | 110.00 |
| | 1.2 | මෝල්ට් 01 ක් | 90.00 |
| | 1.3 | ඉඟුරු සහිත තේ 01 ක් | 30.00 |
| | 1.4 | කොළ කැඳ 01 ක් කිතුල් හකුරු සමග | 90.00 |
| | 1.5 | කොළ කැඳ 01 ක් | 65.00 |
| | 1.6 | කෝපි 01 | 60.00 |
| 02 | | **02.උදේ ආහාර වට්ටෝරුව** | |
| | 2.1 | කඩල හෝ කවුපි හෝ මුං ඇට,පොල් ,කට්ටසම්බල් | 200.00 |

| | | | |
|---|---|---|---|
| | 2.1 | පාන් ½,පරිප්පු හෝ අල ව්‍යංජනය,පොල් සම්බල්,ප්ලේන්ටි | 250.00 |
| | 2.3 | සුදු හෝ රතු කැකුළු බත්,අල හෝ මයිසූර් පරිප්පු,පොල් සම්බල්,කෙසෙල් ගෙඩියක් | 250.00 |
| | 2.4 | සුදු හෝ රතු කැකුළු බත්, අල හෝ මයිසූර් පරිප්පු /හාල්මැස්සන් බැදුම,පොල්සම්බල්/කෙසෙල් ගෙඩියක් | 300.00 |
| | 2.5 | ඉදි ආප්ප 15 ක් /කිරිමාළු හොදි,මයිසූර් පරිප්පු/පොල් සම්බල් | 300.00 |
| | 2.6 | ඉදි ආප්ප 15 ක් හෝ පාන් ½,බිත්තර 1,අල හොදි හෝ පරිප්පු,පොල් සම්බල්,ඉඟුරු තේ | 310.00 |
| | 2.7 | නූඩ්ල්ස් හෝ ඉදිආප්ප 15,මාළු කරිය,අලකරිය,පොල්සම්බල්,කෝපි 01 | 350.00 |
| | 2.8 | මුංකිරිබත් කෑට 03 හෝ කඩල හෝ කවුපි,කට්ට සම්බල් හෝ සීනි සම්බල්,පොල් ,ඉඟුරු තේ | 350.00 |
| | 2.9 | කිරිබත් කෑට 03 කට්ට සම්බල් හෝ සීනි සම්බල්,මාළු ඇඹුල් තියල්,ප්ලේන්ටි 01 | 350.00 |
| | 2.10 | ඉදිආප්ප 10, සුදු හෝ රතු කැකුළු බත්, මයිසූර් පරිප්පු,අලකොළ කරිය,කරවල හෝ බිම්මල් බැදුම,පොල් සම්බල්,කෙසෙල් ගෙඩියක් | 350.00 |
| | 2.11 | සුදු හෝ රතු කැකුළු බත්, මයිසූර් පරිප්පු,කුණිස්සෝ බැදුම,බිම්මල් කරිය,පොල් සම්බල්,කෙසෙල් ගෙඩි | 375.00 |
| | 2.12 | ඉදිආප්ප, සුදු හෝ රතු කැකුළු බත් ,කිරි මාළු හොදි, මයිසූර් පරිප්පු,පොල් සම්බල්,කෙසෙල් ගෙඩියක් | 380.00 |
| | 2.13 | ඉදිආප්ප 10, පාන්½, මාළු ඇඹුල් තියල්, වැටකොළු කරිය,මයිසූර් පරිප්පු,පොල් සම්බල් | 400.00 |
| | 2.14 | සුදු හෝ රතු කැකුළු බත් ,පොල් රොටී 03,දෙල් කරිය හෝ පොළොස් කරිය හෝ බිම්මල් කරිය, මයිසූර් පරිප්පු,මාළු ඇඹුල්තියල්,කට්ටසම්බල්,කෙසෙල් ගෙඩියක් | 450.00 |
| | 2.15 | තෝසේ 03,උළුඳු වඩේ 01,පරිප්පු වඩේ 01,සාම්බාරු,සම්බල්,ප්ලේන්ටි | 475.00 |
| | 2.16 | ඉදිආප්ප 15 හෝ සුදු හෝ රතු කැකුළු බත් ,අලකොළ කරිය,කුකුල්මස් කරිය,කෙසෙල්මුව බැදුම,මයිසූර් පරිප්පු,ගස්ලබු | 550.00 |
| **03.දිවා තේ හා සවස තේ** | | | |
| | 3.1 | මාළු පාන් 01 ,ප්ලේන්ටි | 120.00 |
| | 3.2 | 01පරිප්පු වඩේ 01 ,උළුඳු වඩේ 01 , ඉඟුරු තේ 01 | 160.00 |
| | 3.3 | බිත්තර රෝල්ස් 01,කට්ලට් 01,ප්ලේනටි 01 | 220.00 |
| | 3.4 | කට්ලට් 01 ,ප්ලේන්ටි 01 | 125.00 |
| | 3.5 | රෝල්ස් 01,ප්ලේන්ටි 01 | 125.00 |
| | 3.6 | කට්ලට් 01,සැන්ඩ්විච් 01, ප්ලේන්ටි 01 | 160.00 |
| | 3.7 | මාළු පාන් 01,පරිප්පු වඩේ 01,ප්ලේන්ටි 01 | 150.00 |
| | 3.8 | කේක් කෑලි 01,කෙසෙල් ගෙඩි 01,ප්ලේන්ටි 01 | 150.00 |
| | 3.9 | ලැවරියා 01,ප්ලේන්ටි 01 | 125.00 |
| | 3.10 | පැන් කේක් 01, ප්ලේන්ටි 01 | 110.00 |
| | 3.11 | සැන්ඩ්විච් 01,කේක් කෑලිලි 01,කෙසෙල් ගෙඩි,ප්ලේන්ටි | 190.00 |
| | 3.12 | සැන්ඩ්විච් 01,බිත්තර රෝල්ස් 01,කට්ලට් 01,ප්ලේන්ටි 01 | 250.00 |
| | 3.13 | හැලප 01,කට්ලට්01,ප්ලේන්ටි01 | 200.00 |